# සුදුසුකම් ලද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිළයේ දන්ත සෞඛ්‍ය සේවාව

ඔන්ටේරියෝ ජ්‍යෙෂ්ඨ පුරවැසි දන්ත සෞඛ්‍ය වැඩසටහන (OSDCP) මගින් සුදුසුකම් ලද සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඉහලම තත්ත්වයේ දන්ත සෞඛ්‍ය සේවාවක් සපයනු ලබයි.

## සුදුසුකම් ලබන්නේ කවුරුන්ද?

ඔබ සුදුසුකම් ලබන්නේ:

- ඔබට වයස අවුරුදු 65 හෝ ඊට වැඩිනම්
- ඔබ ඔන්ටේරියෝ හි පදිංචිකරුවෙක් නම්
- තනි ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් ලෙස වාර්ෂික අදායම $25,000 හෝ ඊට අඩුනම් හෝ යුවලක් නම් දෙදෙනාගේම වාර්ෂික ආදායමේ එකතුව $41,500 හෝ ඊට අඩුනම්
- කැනේඩියානු දන්ත සත්කාර සැලැස්ම (CDCP) හැරුණු විට, පුද්ගලික රක්ෂණයක්, හෝ ඔන්ටේරියෝ වර්ක්ස්, ඔන්ටේරියෝ ආබාධිත ආධාර වැඩසටහන වැනි වෙනත් රජයේ වැඩසටහනක් යටතේ ලැබෙන දන්ත ප්‍රතිකාර ආවරණයක්, හෝ රක්ෂණය නොවූවන් සඳහා වන සෞඛ්‍ය ප්‍රතිලාභ ඇතුළු වෙනත් කිසිදු ආකාරයක දන්ත සෞඛ්‍ය ප්‍රතිලාභයකට හිමිකම් නොකියයි නම්. සේවාදායකයා සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරාලන්නේ නම් එම සේවාදායකයා CDCP සඳහා සුදුසුකම් ලැබුවද තවමත් OSDCP සඳහා ද සුදුසු විය හැකිය.

## මා හට දන්ත සෞඛ්‍ය සේවාව ලබාගත හැක්කේ කොතැනින්ද?

පොදු සෞඛ්‍ය ඒකක (PHU) සහ මහජන සෞඛ්‍ය මධ්‍යස්ථාන (CHC), ආදිවාසී (“aboriginal”) සෞඛ්‍ය පිවිසුම් මධ්‍යස්ථාන (AHAC), ඒ සමගම එක එක ප්‍රදේශයන්හි ඇති ජංගම දන්ත සෞඛ්‍යාගාර හරහා දන්ත සෞඛ්‍ය සේවාව සපයයි.

## ආවරණය වන සේවාවන් කවරේද?

- පරීක්ෂණ කිරීම සහ වාර්තා ලබාදීම
- නිවාරණ සේවාවන්
- දත් කුහර සහ කැඩුණු දත් නැවත සකස්කිරීමේ සේවාවන්
- දත් හෝ අසාමාන්‍ය පටක ඉවත් කිරීම සඳහා මුඛ ශල්‍යකර්ම
- එක්ස් කිරණ පරීක්ෂා
- නිර්වින්දනය
- ආසාදන සහ වේදනාවන්ට ප්‍රතිකාර කිරීම සඳහා එන්ඩොඩොන්ටික් සේවාවන්
- විදුරුමස් ආසාදන සහ රෝග වලට ප්‍රතිකාර කිරීම සඳහා පෙරියෝඩොන්ටල් සේවාවන්.

## කෘත්‍රිම දත් කුට්ටම්?

දත් විකෘතිතා නිවැරිදි කිරීමේ සේවාවන්, කෘත්‍රිම දත් කුට්ටම් වැනි දෑ, මද වශයෙන් ආවරණය කරයි. කරුණාකර වැඩි විස්තර සඳහා ඔබගේ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය ඒකකය අමතන්න.

## මම අයදුම් කරන්නේ කෙසේද?

ඔන්ටේරියෝ ජ්‍යෙෂ්ඨ පුරවැසි දන්ත සෞඛ්‍ය සේවාව සඳහා අයදුම් කිරීමට ආකාර කිහිපයක් :

- ඔන්ලයින් අයදුම් කිරීම සඳහා ontario.ca/SeniorsDental වෙත පිවිසෙන්න
- මුද්‍රණය කර, එය පුරවා, අයදුම්පත තැපැල් කරන්න
- ඔබගේ ප්‍රාදේශීය පොදු සෞඛ්‍ය සේවා ඒකකය හෝ CHC හා සහභාගීවීම හෝ AHAC වෙත පිවිස අයදුම්පතක් ලබාගෙන සහ/හෝ ඔබගේ අයදුම්පත සම්පූර්ණ කිරීමට සහාය ලබාගන්න.

## මාහට අනුමැතිය ලැබුනහොත් සිදුවන්නේ කුමක්ද?

ඔබගේ අයදුම්පතට අනුමැතිය ලැබුනහොත්, ඔබට දන්ත කාඩ්පතක් සහ පිළිගැනීමේ පැකේජයක් තැපැල් කරනු ලබයි. සේවාවන් ලබාගැනීම සඳහා, එම කාඩ්පත එම සේවාවන් සපයන පොදු සෞඛ්‍ය ඒකකය, මහජන සෞඛ්‍ය මධ්‍යස්ථානය, හෝ ආදිවාසී (Aboriginal) සෞඛ්‍ය ප්‍රවේශ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරන්න.

මෙම වැඩසටහන සඳහා දිගටම සහභාගිවීමට ඇති හැකියාව, හෝ වැඩසටහනට නැවත අයදුම් කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් සෑම වසරකදීම ඔබට දැනුම් දෙනු ලබයි.

## මට උදවු අවශ්‍ය නම්?

අමතන්න 416-916-0204
ගාස්තු රහිත ඇමතුම් 1-833-207-4435
TTY 1-800-855-0511

Ontario

SINHALA – FREE ROUTINE DENTAL CARE FOR ELIGIBLE SENIORS. Publication No. (300082). ISBN 978-1-4868-5415-8. PDF. August 2024. © King's Printer for Ontario, 2024.